# 18. ධාතුසෙනො/නරිස්සරො

## අට්ඨාරසමො පාඨො



පුබ්බෙ අනුරාධපුරං නාම අග්ගනගරං අහොසි. තස්මිං නගරෙ මහානාමො නාම මහාථෙරො විහාසි. සො පණ්ඩිතො, සද්දසත්ථ කොවිදෙ, මෙධාවි ච භවති. තස්මිං නගරෙ දහරො රාජකුමාරො ච විහාසි. ධාතුසෙනො නාම තස්ස නාමං. සො කුමාරො අනුදිනං මහාවිහාරං ගච්ඡති. සො පච්ඡා පරොපද්දව භයෙන මහානාමථෙරස්ස සන්තිකෙ පබ්බජි. සො සාමණෙරො එකදා අත්තනො ආචරියෙන සද්ධිං පච්චන්තං අගමි. ගමනමග්ගෙ එකං කුනනදිං දිස්වා මහානාම ථෙරො එවමාහ. ''භො! සාමණෙර! යදි ත්වං අස්මිං දීපෙ රජ්ජං ලභෙය්‍ය; තදා එත්ථ එකං වාපිං බන්ධාපෙහීති''

සො සාමණෙරො පච්ඡා උප්පබ්බජිත්වා ලඞ්කාරජ්ජං ලභි. සො රාජා අතී'ව ධම්මිකො අත්තනො ආචරියස්ස වචනං සරිත්වා තත්ථ වාපිං බන්ධාපෙසි. අජ්ජ සා වාපි ''කලාවාපී'' ති පඤ්ඤායති.

**(පාලි රචනා 1 පූජ්‍ය බද්දේගම විමලවංස අනුනායක ස්ථවිර)**

## වචන මාලාව

1. පුබ්බෙ - පෙර
2. අග්ගනගරං - අගනුවර
3. විහාසි - වාසය කළේ ය
4. මෙධාවි - නුවණැත්තා
5. අනුදිනං - දිනපතා
6. පරොපද්දවභයෙන - සතුරු උවදුරු බියෙන්
7. පබ්බජි - පැවිදි විය
8. භො - පින්වත්
9. යදි - ඉඳින්, යම් හෙයකින්
10. දීපෙ - රටෙහි
11. රජ්ජං - රාජ්‍යය
12. ලභෙය්‍ය - ලබන්නේ නම්
13. බන්ධාපෙහි - කරව, බඳව
14. අතී'ව - අතිශයින්ම
15. අත්තනො - තමාගේ
16. සරිත්වා - සිහි කොට
17. කලාවාපි - කලා වැව
18. පඤ්ඤායති - ප්‍රසිද්ධයි
19. උපපබ්බජිත්වා - උපැවිදි වී

# නිපාත පද

''හො, ච, යදි, තදා, ඉව'' යන පද ඉහත පාඩමෙන් අපට හමුවිය. මේ පද නිපාත පද නමින් හැඳින්වෙයි. භාෂාව පහසුවෙන් ලිවීම සඳහා අපට නිපාත පද අවශ්‍ය වේ.

- නිපාත පද සෑම තැන ම එක ම ආකාරයට පවතියි.
- විභක්ති අනුව වෙනස් නොවේ.
- කාල අනුව වෙනස් නොවේ.
- ඒකවචන බහුවචන භේදයක් ද නැත.

නිපාත පද භාවිත කොට තැනූ මේ වාක්‍ය දෙස බලන්න.

- මාතා <u>ච</u> පිතා <u>ච</u> **ගෙහං ගච්ඡන්ති** - මව ද පියා ද ගෙදර යති.
- **අහං පත්තං <u>වා</u> පුප්ඵං <u>වා</u> සාඛං <u>වා</u> ලභිතුං ඉච්ඡාමි** මම කොළයක් හෝ මලක් හෝ අත්තක් හෝ ලැබීමට කැමැති වෙමි.
- **<u>යථා</u> ඉදං පුප්ඵං මිලායාති <u>තථා</u> මෙ කායො විනාසභාවං යාති** යම්සේ මේ මල මැලවේ ද එසේ මාගේ ශරීරය විනාශයට යයි.
- **සො <u>හීයො</u> ගාමං අගමාසි** හෙතෙම ඊයේ ගමට ගියේ ය.
- **ඉමෙ චොරා <u>කිර</u> <u>අජ්ජ</u> තව ගෙහං ආගමිස්සන්ති** මේ හොරු වනාහි අද නුඹේ ගෙදරට එන්නාහ.

## අභ්‍යාසය 18 1

**01. සිංහලට නගන්න.**

1. **ආම, මයං පුන එවං න කරිස්සාම.**
2. **යත්‍ථ අම්බු හොති තත්‍ථ පදුමානි ජායන්ති.**
3. **යාව තව ගරවො ඉධ ආගච්ඡිස්සන්ති තාව ත්‍වං ඉධ තිට්ඨාහි.**
4. **වාණිජා ගාමම්හා බහි වසිස්සන්ති.**
5. සො බිප්පං ධම්මං විජානාති.

02. පාලියට නගන්න.

1. නුඹලා හෝ අපි හෝ එහි යමු.
2. සමුද්‍රය හාත්පස පර්වතයෝ වෙත්.
3. ඉදින් නුඹ එහි යන්නෙහි නම් මම ද නුඹ සමග එන්නෙමි.
4. මහණ, පිටවෙන්න යැයි ආලවක යක්ෂයා කීවේ ය.
5. ගවයෝ ගස යට තණ කති.

03. ඔබ දන්නා නිපාත පද පහක් යොදා වාක්‍ය පහක් තනන්න.

**04. මෙතෙක් ඔබට පාලි භාෂා පොත් ඉගෙනීමේ දී හමු වී ඇති නිපාත පද ලැයිස්තුවක් සාදන්න.**

**05. පාඩමේ ඇති ඡේදය සිංහලට නගන්න.**

**මෙම ශබ්දය වාචෝද්ග්‍රහණය කරන්න.**

| අකාරාන්ත සර්වනාම නපුංසක ලිංග "සබ්බ" ශබ්දය (සියල්ල) | | |
|---|---|---|
| **විභක්තිය** | **ඒකවචන** | **බහුවචන** |
| **පඨමා** | සබ්බං | සබ්බෙ, සබ්බානි |
| **ආලපන** | (හෙ) සබ්බ, සබ්බා | (හෙ) සබ්බෙ, සබ්බානි |
| **දුතියා** | සබ්බං | සබ්බෙ, සබ්බානි |
| **තතියා** | සබ්බෙන | සබ්බෙහි, සබ්බෙභි |
| **කරණ** | සබ්බෙන | සබ්බෙහි, සබ්බෙභි |
| **චතුත්ථී** | සබ්බස්ස | සබ්බෙසං, සබ්බෙසානං |
| **පඤ්චමී** | සබ්බම්හා, සබ්බස්මා | සබ්බෙහි, සබ්බෙභි |
| **ඡට්ඨී** | සබ්බස්ස | සබ්බෙසං, සබ්බෙසානං |
| **සත්තමී** | සබ්බම්හි, සබ්බස්මිං | සබ්බෙසු |

| අකාරාන්ත සර්වනාම ඉත්ථි ලිංග ''සබ්බ'' ශබ්දය (සියල්ල) | | |
|---|---|---|
| විභක්තිය | ඒකවචන | බහුවචන |
| පඨමා | සබ්බා | සබ්බා, සබ්බායො |
| ආලපන | (හෙ) සබ්බෙ | (හෙ) සබ්බා, සබ්බායො |
| දුතියා | සබ්බං | සබ්බා, සබ්බායො |
| තතියා | සබ්බාය | සබ්බාහි, සබ්බාභි |
| කරණ | සබ්බාය | සබ්බාහි, සබ්බාභි |
| චතුත්ථි | සබ්බස්සා, සබ්බාය | සබ්බාසං, සබ්බාසානං |
| පඤ්චමී | සබ්බාය | සබ්බාහි, සබ්බාභි |
| ඡට්ඨී | සබ්බස්සා, සබ්බාය | සබ්බාසං, සබ්බාසානං |
| සත්තමී | සබ්බස්සං, සබ්බායං, සබ්බාය | සබ්බාසු |

මෙම නිපාත පද මාලාව අර්ථ සහිත ව පාඩම් කරන්න.

1. එවං - මෙසේ
2. අථ - ඉක්බිති
3. අථවා - නොහොත්
4. සනිකං - හෙමින්
5. උපරි - මත්තෙහි
6. හෙට්ඨා - යට
7. තිරියං - හරහා
8. බහි - පිට
9. කුතො - කොතැනින්
10. තතො - එතැනින්

11. ඉධ - මෙහි

12. පන - වනාහි

13. කිර - වනාහි

14. ඛලු - වනාහි

15. පුන - නැවත

16. අද්ධා - ඒකාන්තයෙන්

17. අන්තරා - අතරෙහි

18. කත්ථ - කොහි

19. කුහිං - කොහි

20. සමන්තා - හාත්පස

21. අන්තො - ඇතුළෙහි

22. ඉතො - මෙතැනින්

23. ඛිප්පං - වහා

24. වා - හෝ, නොහොත්

25. නහි - නැහැ

26. ආම - ඔව්/එසේ ය

27. අජ්ජ - අද

28. හීයො - ඊයේ

29. සුවෙ - හෙට

30. කථං - කෙසේද

31. ච - ද

32. න - නොවේ

33. එව - ම

34. අපි - ත්

35. ඉදානි - දැන්

36. තදා - එකල

37. යදා - යම්කල

38. කදා - කවදා

39. සබ්බදා - සැමදා

40. සායං - සවස

41. පාතො - උදේ

42. අත්‍ර - මෙහි

43. තත්‍ර - එහි

44. විනා - හැර

45. නානා - නොයෙක්

46. සතතං - නිතර